ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

உள்நாட்டலுவல்கள் அமைச்சு

**Ministry of Home Affairs**

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල**

**மாவட்ட செயலகம் - கேகாலை**

**District Secretariat – Kegalle**

වියදම් ශීර්ෂය / செலவினத் தலைப்பு / **Head No - 279**

**කාර්යසාධන වාර්තාව සහ ගිණුම්**

செயலாற்றுகை அறிக்கையும் கணக்குகளும்

# Performance Report & Accounts

# 2015



පටුන


| අංකය | මාතෘකාව | උප මාතෘකාව | පිටු අංකය |
|---|---|---|---|
| 1 | දිස්ත්‍රික් ලේකම්තුමාගේ පණිවුඩය | දිස්ත්‍රික් ලේකම්තුමාගේ පණිවුඩය | 03 |
| | | දැක්ම ,මෙහෙවර හා අගයන් | 05 |
| | | අපගේ සේවාවන් | 06 |
| | | අරමුණු, කාර්යයන් හා ක්‍රියාවලි | 07-08 |
| 2 | දිස්ත්‍රික්කය හැඳින්වීම | දිස්ත්‍රික්කය පිළිබඳ හැඳින්වීම | 09 |
| | | දිස්ත්‍රික්කයේ සිතියම | 10 |
| | | ඓතිහාසික වැදගත්කම | 11 |
| | | ස්වභාවික සම්පත් | 12 |
| | | ජනතාවගේ ජීවන වෘත්තීය රටාවන් හා ප්‍රධාන වෙළඳ හා ආර්ථික කටයුතු | 12 |
| | | වාරිමාර්ග ක්‍රමය | 12 |
| | | වර්ෂාපතන රටාව | 12 |
| | | ජනගහන තොරතුරු | 13 |
| | | දිස්ත්‍රික්කය පිළිබඳ සංඛ්‍යා තොරතුරු | 14 |
| | | සංවිධාන සටහන | 15 |
| | | අනුමත කාර්ය මණ්ඩලය | 16 |
| 3 | කාර්ය සාධනය | **පොදු පරිපාලන කටයුතු** | |
| | | 2015 ක්‍රියාකාරි සැලැස්ම | 17 |
| | | අභ්‍යන්තර විගණන කටයුතු | 18-19 |
| | | ආදායම් රැස්කිරිම | 20-21 |
| | | මානව සම්පත් සංවර්ධනය | 22 |
| | | මැතිවරණ කටයුතු | 23 |
| | | මාධ්‍ය හා ප්‍රවෘත්ති කටයුතු | 24 |
| | | ආපදා කළමනාකරණ කටයුතු | 24-26 |
| | | පුද්ගලයන් හා ඉඩම් ලියාපදිංචි කටයුතු | 27 |
| | | සහතික හා වාර්තා | 28 |
| | | බලපත්‍ර නිකුත් කිරිම | 29 |
| | | ලියාපදිංචි කිරිම් | 30 |
| | | මෝටර් රථ ප්‍රවාහන | 31 |
| | | මිණුම් හා ප්‍රමිති සේවා | 32 |
| | | සංඛ්‍යාලේඛණ | 33 |
| | | **සමාජසේවා සහ සංස්කෘතික කටයුතු** | |
| | | සංස්කෘතික හා ආගමික කටයුතු | 34 |
| | | සමාජ ආරක්ෂණ වැඩසටහන් | 35 |
| | | දිස්ත්‍රික්කයේ ක්‍රිඩා කටයුතු | 36 |
| | | මහජන ආධාර හා විශ්‍රාම වැටුප් | 37 |
| | | සමෘද්ධි සහනාධාර | 38 |
| | | **සංවර්ධන කටයුතු** | |
| | | ගම් 15000,මාතෘ සායන,කඳුරට නව ගම්මාන වැඩසටහන | 39-41 |
| | | පළාත් සභා ආයෝජන | 42-43 |
| | | සමෘද්ධි ක්‍රියාකාරි වැඩසටහන | 44-46 |
| 4 | වාර්ෂික ගිණුම් | ඩී.ජී.එස්.ඒ.2 | 47 |
| | | ඩී.ජී.එස්.ඒ.3 | 48 |
| | | ඩී.ජී.එස්.ඒ.4 | 49-50 |
| | | ඩී.ජී.එස්.ඒ.5 | 51-52 |
| | | රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් 'බී' ගිණුමේ තොරතුරු | 53-54 |
| | | පොදු තැන්පත් ගිණුම | 55 |

# දිස්ත්‍රික් ලේකම්තුමාගේ පණිවිඩය...



දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලනයේ කේන්ද්‍රස්ථානය ලෙස සැලකෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට දිස්ත්‍රික් සංවර්ධන ක්‍රියාවලියේ දි විශාල කාර්යභාරයක් හා වගකීමක් පැවරී ඇති රාජ්‍ය ආයතනයක් බව සඳහන් කිරිමට කැමැත්තෙමි. ඒ අනුව කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය සංවර්ධන අරමුණු ප්‍රශස්ත මට්ටමින් ළගා කර ගැනීමට **අවශ්‍ය සම්බන්ධීකරණය,නායකත්වය හා ප්‍රගතිපාලනය** ලබා දීම තුළින් ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් මහජනතාවගේ සමාජ ආර්ථික, භෞතික අධ්‍යාත්මික සංස්කෘතික හා තොරතුරු තාක්ෂණය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ඉහළ නැංවීම තුළින් මහජනතාවගේ සුභසාධනය හා ප්‍රාදේශීය සංවර්ධනයේ මංපෙත් විවර කර කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රජාවගේ ජීවන තත්වය උසස් කිරීමට හැකිවීම අප ලැබූ ජයග්‍රහණයක් බව නිහතමානීව සඳහන් කරමි.

විශේෂයෙන්ම ශ්‍රී ලංකාව තුළ දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් සමතුලිත ජාතික සංවර්ධනයක් ඇති කිරිමට ප්‍රයත්න දරන මෙවන් අවස්ථාවක මෙම ජාතික මෙහෙවරේ කොටස්කරුවෙකු විමට අප දිස්ත්‍රික් ලේකම් කාර්යාලයටද අවස්ථාව ලැබි ඇත.

විමධ්‍යගත පරිපාලන රටාවක් තුළ යහපත් මානව සම්පත් කළමනාකරණය තුළින් ගුණාත්මක,කාර්යක්ෂම හා ඵලදායි මහජන සේවයක් ලබාදිමටත් 2015 වර්ෂය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අපේක්ෂිත අරමුණු හා ඉලක්ක සපුරා ගැනීම සඳහාත් දේශපාලන නායකත්වයේ සහයෝගයත් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු අනිකුත් රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ටත් මෙම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් වරුන් ඇතුළු සමස්ත කාර්යමණ්ඩලයටත් මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි.

ඩබ්.එම්.අබේවික්‍රම වනසූරිය,
දිස්ත්‍රික් ලේකම් / දිසාපති කෑගල්ල සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

# හැඳින්වීම

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හා 2002.09.12 හි 2:4 ඡේදය පරිදි පිළියෙළ කළ කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 වසරට අදාළ කාර්යසාධන වාර්තාව හා ගිණුම් මේ සමඟ ඉදිරිපත් කරමි.

කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඊට අනුබද්ධ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 11 ආවරණය වන පරිදි මූල්‍ය හා වෙනත් කාර්යයන් මත වූ දත්ත හා තොරතුරු අවශ්‍ය වන අවස්ථාවල දී සංසන්දනාත්මකව කාර්යසාධනය පිළිඹිබු වන පරිදි මෙම වාර්තාවට ඇතුලත් කර තිබේ.

2015.05 . 19 වන දින
කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදීය.

ඩබ්.එම්,අබේවික්‍රම වනසූරිය,
දිස්ත්‍රික් ලේකම් / දිසාපති කෑගල්ල සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ
අතිරේක ලේකම්.

# දිස්ත්‍රික් පරිපාලනය

## දැක්ම

කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
දිවයිනේ විශිෂ්ටතම ආයතනය බවට පත් කිරිම

## මෙහෙවර

රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව දිස්ත්‍රික්කයට
ආවේණික වු උරුමයන් සුරකිමින් කෑගල්ල දිස්ත්‍රික්කය
තිරසාර සංවර්ධනයක් කරා ගෙන යාම.

## අගයන්

- ආචාරශිලි සහ සුහද සේවය
- ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ට ප්‍රමුඛතාවය ලබාදීම.
- කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරිම.
- පරිසර හිතකාමි කාර්යාල පරිශ්‍රයක්
- උපරිම පාරිභෝගික සත්කාරය මඟින් සේවාලාභීන් අමන්දානන්දයට පත් කිරිම.

## අපගේ සේවාවන්

- රජයේ දිස්ත්‍රික් නියෝජිත ආයතන ලෙස කටයුතු කිරිම.
- රජයේ දෙපාර්තමේන්තු හා ආයතන සම්බන්ධීකරණය කිරිම.
- දිස්ත්‍රික් සංවර්ධන සැලැස්ම හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව ක්‍රියාත්මක කිරිම.
- සංවර්ධන හා පරිපාලන කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම,මුල්‍යකරණය.
- කෑගල්ල දිස්ත්‍රික්කයේ ඡන්ද හිමි නාමලේඛණ පවත්වාගෙන යාම හා අදාළ සහතික නිකුත් කිරිම.
- රජය විසින් ප්‍රකාශයට පත්කරනු ලබන ඡන්ද විමසීම් පැවැත්වීම.
- ජාතික හා දිස්ත්‍රික් උත්සව සංවිධානය කිරිම.
- දිස්ත්‍රික් මිල නියම කිරිම්, ආපදා හා සුභ සාධන, ආරක්ෂණ,වන සම්පත්,පරිසර,නිවාස ඉදිකිරීම්, ළමා රක්ෂණ,ඉඩම් පරිහරණ හා කෘෂිකර්ම සංවර්ධනයට අදාළ කමිටු ක්‍රියාත්මක කිරිම.
- සමෘද්ධි වැඩසටහනට අදාළ කටයුතු ප්‍රාදේශිය ලේකම් කාර්යාල හා සම්බන්ධිකරණය.
- කුඩා ව්‍යාපාර සංවර්ධනයට අදාළ පුහුණු හා මඟ පෙන්වීම්.
- මිණුම් ඒකක නියමිත ප්‍රමිතීන් යටතේ පවත්වාගෙන යාම සහතික කිරිම.
- ඉඩම් ඔප්පු ලියාපදිංචිය, උප්පැන්න,මරණ,විවාහ ලියාපදිංචි කිරිම සම්බන්ධිකරණය.
- පාරිභෝගික ආරක්ෂණ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරිම.
- රියදුරු බලපත්‍ර නිකුත් කිරිම හා මෝටර් රථ ආඥාපනතට අදාළ විධිවිධාන ක්‍රියාත්මක කිරිම.
- විශ්‍රාම වැටුප් වැඩසටහන සම්බන්ධිකරණය.
- වෘත්තීය මාර්ගෝපදේශ කටයුතු.
- ඵලදායිතා වර්ධනය සඳහා දැනුවත් කිරිම.
- දිස්ත්‍රික්කයේ විවිධ අංශයන්ට අදාළ සංඛ්‍යාලේඛණ යාවත්කාලීනව පවත්වාගෙන යාම.
- ගිනි අවි,පුපුරණ ද්‍රව්‍ය දැව තොරතුරු බලපත්‍ර කටයුතු.
- දිස්ත්‍රික් හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල නිලධාරින් ගේ ආයතනික කටයුතු.

## <u>දිසාපති / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අරමුණු</u>

I. යුක්ති ගරුක,සාධාරණ රාජ්‍ය පරිපාලනයක් තහවුරු කිරිම සඳහා දායකවීම.

II. පැවරුන බලතල හා සම්පත් උපරිම ඵලදායි ලෙස යොදා ගනිමින් ජනතාවගේ අභිලාෂයන් හා අපේක්ෂාවන් ඉටුකිරිම.

## දිසාපති / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යයන්

I. ව්‍යවස්ථාපිත අණපනත් මගින් පැවරි ඇති බලතල හා වගකිම් ඉටුකිරිම.

II. රජයේ ප්‍රධාන සංවර්ධන වැඩ සටහන් හා සංවර්ධන ව්‍යාපෘති(සමෘද්ධි,ගම නැඟුම හා විමධ්‍යගත වැඩ සටහන්) රජයේ නියමයන්, උපදෙස් හා මගපෙන්වීම් වලට අනුකූල වන පරිදි ක්‍රියාවට නැංවීම සහතික කිරිම.

III. දිස්ත්‍රික්කයේ සියළු රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන මඟින් ජනතා අභිවෘද්ධිය සඳහා ඉටුකරනු ලබන සංවර්ධන වැඩසටහන් හා පරිපාලන කටයුතු යථාවත් පරිදි ක්‍රියාවට නැංවීමට අවශ්‍ය සමායෝජනය, සම්බන්ධීකරණය හා මඟ පෙන්වීම.

IV. ආණ්ඩුවේ දිස්ත්‍රික් නියෝජිතයා ලෙස කටයුතු කිරිම.

V. ස්භාවික හා වෙනත් ව්‍යසන හා ආපදා දිස්ත්‍රික්කය තුල ඇතිවූ අවස්ථා වලදි ප්‍රායෝගිකව මැදිහත්වි කටයුතු කිරිම.

## <u>දිසාපති / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල කාර්යයන් ඉටුකිරිම සඳහා වූ ක්‍රියාවලි</u>

**1. පරිපාලන**

I.දිසාපති / දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල අතර නිලධාරීන් අනුයුක්ත කිරිම හා පෞද්ගලික ලිපිගොනු රාජකාරි

II.මානව සම්පත් සංවර්ධනය - අධීක්ෂණය, පුහුණු හා උපදෙස් ලබාදිම.

2. **ආර්ථික සංවර්ධන**

I.දිස්ත්‍රික් සම්බන්ධිකරන කමිටුව ස්ථාපනය කර පවත්වාගෙන යාම.

II.දිස්ත්‍රික් සම්බන්ධිකරන කමිටු තිරණ ක්‍රියාවට නැංවිම.

III.දිස්ත්‍රික් සංවර්ධන කමිටුව ස්ථාපනය කර පවත්වාගෙන යාම.

IV.දිස්ත්‍රික් සංවර්ධන කමිටු තිරණ ක්‍රියාවට නැංවිම.

V.විමධ්‍යගත අයවැය වැඩ සටහන්

අ).සැලසුම් කිරිම ආ). ක්‍රියාවට නැංවිම ඇ). ඇගයිම ඈ). පසුවිපරම

VI. සමෘද්ධි සංවර්ධන වැඩ සටහන්

අ). සැලසුම් කිරිම ආ). ක්‍රියාවට නැංවිම ඇ). ඇගයිම ඈ). පසුවිපරම

3. මූල්‍ය කළමණාකරණය

I. ස්ථාවර වත්කම් අත්කර ගැනිම, නඩත්තුව, පරිපාලනය, ගිණුම් හා වාර්තා තැබිම.
II. වියදම් ඇස්තමේන්තු කිරිම, ගෙවිම, ගිණුම් තැබිම හා වාර්තා කිරිම.
III. ආදායම් ඇස්තමේන්තු කිරිම, එකතු කිරිම, ගිණුම් තැබිම හා වාර්තා කිරිම.
IV. ප්‍රතිපාදන වෙන් කිරිම, අක් මුදල් නිදහස් කිරිම හා ඊට අදාළ ගිණුම් තැබිම හා වාර්තා කිරිම.

4. සමාජ සංවර්ධන

I. සංස්කෘතික වැඩ සටහන්

අ).සැලසුම් කිරිම ආ). ක්‍රියාවට නැංවිම ඇ). ඇගයිම ඈ). පසුවිපරම

II. පාරිසරික වැඩ සටහන්

අ).සැලසුම් කිරිම ආ). ක්‍රියාවට නැංවිම ඇ). ඇගයිම ඈ). පසුවිපරම

5. සමාජ සේවා

I.සමෘද්ධි සහනාධාරලාභින් තෝරාගැනිම, ආධාර ලබාදිම, ගිණුම් හා වාර්තා තැබිම.
II.මහජන ආධාර හා වෙනත් ආධාරලාභින් තෝරා ගැනිම, ආධාර ලබාදිම, ගිණුම් හා වාර්තා තැබිම.
III.විශ්‍රාම වැටුප් ගණන් බැලිම, ගෙවිම, වාර්ථා හා ගිණුම් තැබිම.

6. ව්‍යවස්ථාපිත කාර්යයන්

I. බලපත්‍ර නිකුත් කිරිම, වාර්තා තැබිම
II. සහතික නිකුත් කිරිම, වාර්තා තැබිම .
III. ලියාපදිංචි කිරිම, වාර්තා තැබිම .

7. වෙනත් රාජකාරි

1. මැතිවරණ පැවැත්විම.
2. වෙනත් විවිධ දෙපාර්තමේන්තු රාජකාරී

| | | | | |
|---|---|---|---|---|
| I. | කෘෂිකර්ම | - | ව්‍යවස්ථාමය හා ආයතනික බලතල හා රාජකාරි මෙහෙයවිම, වාර්තා තැබිම හා සම්බන්ධිකරණය | |
| II. | ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන | - | එම | - |
| III. | මෝටර් රථ ප්‍රවාහන | - | එම | - |
| IV. | ආගමන හා විගණන | - | එම | - |
| V. | රෙජිස්ට්‍රාර් ජනරාල් | - | එම | - |
| VI. | ඉඩම් කොමසාරිස් | - | එම | - |
| VII. | ක්ෂේත්‍ර මට්ටමින් අමාත්‍යාංශ මට්ටමේ විවිධ රාජකාරි | - | එම | - |

# 3.දිස්ත්‍රික්කය පිළිබඳ හැඳින්වීම

සබරගමු පළාතේ පිහිටි කෑගල්ල දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ මධ්‍ය කඳුකර ප්‍රදේශයත් නිරිත දිග තැනිතලා ප්‍රදේශයත් අතරමැද පිහිටි රමණීය පරිසරයකින් යුත් බිම් ප්‍රදේශයකි. රුහුණු , මායා, පිහිටි යන ත්‍රි සිංහලයෙන් මායා රටට අයත් ප්‍රදේශයකි.පරිපාලනමය වශයෙන් දිස්ත්‍රික්කය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 11 කට බෙදා දක්වා ඇත.

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ සහ ඒවාට අයත්වන ග්‍රාම නිලධාරි වසම් පිළිබඳ විස්තර

| | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | ග්‍රාම නිලධාරි වසම් ගණන |
|---|---|---|
| 1. | කෑගල්ල | 61 |
| 2. | ගලිගමුව | 51 |
| 3. | වරකාපොල | 78 |
| 4. | රඹුක්කන | 89 |
| 5. | මාවනැල්ල | 71 |
| 6. | අරණායක | 61 |
| 7. | යටියන්තොට | 32 |
| 8. | දැරණියගල | 26 |
| 9. | රුවන්වැල්ල | 38 |
| 10. | දෙහිඕවිට | 39 |
| 11. | බුලත්කොහුපිටිය | 27 |
| | එකතුව | 573 |

## භූගෝලීය පිහිටීම

කෑගල්ල දිස්ත්‍රික්කය උතුරු අක්ෂාංශ 6.50 – 7.20 සහ නැගෙනහිර දේශාංශ 80.10 ත් 80.35 ත් අතර පිහිටා තිබේ.උතුරින් කුරුණෑගල දිස්ත්‍රික්කයෙන්ද ,දකුණින් රත්නපුර දිස්ත්‍රික්කයෙන්ද,නැගෙනහිරින් මහනුවර සහ නුවරඑළිය දිස්ත්‍රික්ක වලින්ද,බටහිරින් ගම්පහ සහ කොළඹ යන දිස්ත්‍රික්ක වලටද මායිම් වේ.කි.මී.48 ක් වු උතුරු දකුණු විහිදීමකින්ද කි.මී. 32 ක් පමණ වු නැගෙනහිර හා බස්නාහිර විහිදීමකින්ද යුත් මෙම ප්‍රදේශය ව.කි.මී. 1692.8 (ව.සැ.645) ක විශාලත්වයකින් යුක්ත වේ.


Administrative Boundaries- Kegalle District
N
To Kurunegala
To Polgahawela
To Kandy
Gampola
From Colombo
To Hatton
To Avissawella
To Ehaliyagoda
Rambukkana
Kegalle
Mawanella
Galigamuwa
Nelundeniya
Warakapola
Galapitamada
Aranayaka
Bulathkohupitiya
Ruwanwella
Yatiyantota
Dehiowita
Deraniyagala
Legend
Aranayaka
Bulathkohupitiya
Dehiovita
Deraniyagala
Galigamuwa
Kegalle
Mawanella
Rambukkana
Ruwanwella
Warakapola
Yatiyanthota
Prepared by District Land use Planning office Kegalle

## දිස්ත්‍රික්කයේ ඓතිහාසික වැදගත්කම

ශ්‍රී ලංකා ඉතිහාසයේ දේශපාලන, ආර්ථික, සමාජීය ,ආගමික හා සංස්කෘතික තොරතුරු විමසා බලන විට කැගල්ල දිස්ත්‍රික්කය දෙවනි වෙන්නේ අනුරාධපුර සහ පොළොන්නරු දිස්ත්‍රික්ක වලට පමණි. ප්‍රාග් ඓතිහාසික යුගයේ පටන් වර්තමානය දක්වා සෑම යුගයකටම අයත් ඉතිහාසය හා බැඳි පවති.සෑම යුගයකටම අයත් පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික වටිනාකම් ඇති ස්ථාන,නටඹුන්,අභිලේඛන හා විවිධ වර්ගයේ සාහිත්‍ය මූලාශ්‍ර හමු වී ඇත.

මෙරටට බුදු දහම හඳුන්වාදීමත් සමඟම දෙවන පැතිස් රජ සමයට සමකාලීනව දඹදිව සිටි ධර්මාශෝක රජුගේ බ්‍රාහ්මීය අක්ෂර ලිපි වලට අනුකූල බ්‍රාහ්මීය අක්ෂරයෙන් රචිත ලෙන් ලිපි රාශියක් ලංකාවේ විවිධ පළාත් වලින් හමුවී ඇත. මෙවැනි බ්‍රාහ්මී ලිපි කැගල්ල දිස්ත්‍රික්කයේ අම්බලකන්දට නුදුරු පෝඩාපේ,අළුලෙන,අඹේපුස්ස,සල්ගල,ලෙනගල,දනකිරිගල,යටහලෙන,හීනටිගල,පදවිගම්පොල ආදි විවිධ ස්ථාන වලින් හමුවී ඇත.දිස්ත්‍රික්කය පුරා විවිධ කරුණු සම්බන්ධයෙන් වූ සෙල්ලිපි රාශියක් ද හමුවී ඇත.උදාහරණයක් ලෙස දෙවනගල අංක 1 සෙල් ලිපිය,දැදිගම අභයදාන සෙල් ලිපිය දැක්විය හැකිය.

පාෂාණ යුගයට අයත් මිනිසුන් වාසය කරන්නට ඇතැයි සිතිය හැකි ඉපැරණි ගල්ලෙන් රාශියක්ද කෑගලු දිස්ත්‍රික්කයේ දක්නට ඇත.දොරවක අලුලෙන,අස්මඩල,පදවිගම්පල,බතලේගල,ලෙනගල,අම්බලකන්ද, හැලමඩ,හිටිපන.උතුවක්කන්ද,බෙලිගල,සැලව,යටහාලෙන,සල්ගල,කැලැ දඹුල්ල.ක්‍රි.පූ.20,000-30,000 අතරවන ශිලා යුගයට අයත් ගල් මෙවලම් ,හැලිවලං,ඇටකැබලි දොරවක කැනීම් වලින් හමුවී ඇත.රඹුක්කන පදවිගම්පොල ටංකිත මංචකය නම් ගල් කාමරයේ ඇති විශාල ගල් ලෑලි දෙක හා ගල්මෙවලම් ක්‍රි.ව.4000-5000 යුගයට අයත් සේ සලකනු ලැබේ.එයින් පාෂාණ යුගයේ මුල් අවධියේම මෙම ප්‍රදේශයේ මිනිස් ජනාවාස තිබූ බව සනාථ කෙරේ.මාවනැල්ලට නුදුරු අස්මඩලෙන් මිනිස් ඇට සැකිලි සහිත වළං කැබලි කිහිපයක් හමු වූ බව සඳහන් වේ.අස්මඩල ඉහල කන්ද ගල්ලෙනෙහි දොරවක ලෙනේ මෙන් කුරුළු චිත්‍ර,ඉර හඳ සහ සත්ත්ව රූප ඇති නිසා ආදිතම මානවයා කෑගලු දිස්ත්‍රික්කය ජනාවාස කරගෙන සිටි බව පෙනේ.

බුදු සමය මෙරටට හඳුන්වාදුන් ක්‍රි.පූ.3 සියවස හා ඊට පසුව කර ඇති බෞද්ධ ස්මාරක ගණනාවක්ද මෙම ප්‍රදේශයෙන් හමු වි ඇත.සංඝමිත්තා තෙරණිය යොදුනක් යොදුනක් පාසා ස්ථූප කර වූ බව දීපවංශයේ හා මහා වංශයේ දැක්වේ. දැලිවල කොටවෙහෙර එවැනි ස්ථූපයකි.ලංකාවේ අන්තිම මහරහතන් වහන්සේ ලෙස ප්‍රසිද්ධ මලියදේව මහරහතුන් වහන්සේගේ ධාතු තැන්පත් කර ඇති තැන ලෙස සැලකෙන වට්ටාරම විහාරස්ථානයද මෙහි පිහිටා ඇත.කෑගලු ඉතිහාසයට වැදගත් ආලෝකයක් දෙන තවත් ස්මාරකයකි. කරඬුපන අළුලෙන.කැගල්ලට පමණක් නොව ශ්‍රී ලාංකීය ඉතිහාසයටම ආලෝකයක් දෙන තවත් ඓතිහාසික ස්ථානයකි දෙවනගල. මෙවන් ඓතිහාසික වටිනාකම් වලින් යුත් ස්ථාන වලින් කිහිපයක් මෙසේ දැක්විය හැකිය. 1887 දි ඉදිකල ජුබිලි අම්බලම,අක්කර 200 පුරා විහිදි ඇති කුරුළු කැලේ රක්ෂිතය සහ එහි ඇති වසර 150 ක් පමණ පැරණි පුස් වැල,ශ්‍රී ලංකාවේ විශාලතම ආරුක්කු පාලම මෙන් ම ආසියාවේ විශාලතම ගඩොල් පාලමද වන මාවනැල්ල ගඩොල් ආරුක්කු පාලම,ගිරුවා අම්බලම,සරදියෙල්ගල,අළුත්නුවර ශ්‍රී දැඩිමුණ්ඩ දේවාලය, බෙලිගම්මන පොත්ගුල් විහාරය, පදවිගම්පොල ගල් මැස්ස,දැලිවල කොටවෙහෙර,දැදිගම කොටවෙහෙර,සීතාවක බැරැණ්ඩි කෝවිල. මෙසේ බලන කල ඓතිහාසික වටිනාකම් වලින් යුත් ස්ථාන රාශියකින් හෙබි දිස්ත්‍රික්කයක් ලෙස කැගල්ල දිස්ත්‍රික්කය හැඳින්විය හැකිය.

## ස්වභාවික සම්පත්

ශ්‍රී ලංකාවේ හොඳම මිනිරන් නිධිය කෑගල්ල දිස්ත්‍රික්කයේ බෝගල පිහිටා ඇත

## ජනතාවගේ ජීවන වෘත්තීය රටාවන් හා ප්‍රධාන වෙළඳ හා ආර්ථික කටයුතු

කෘෂිකර්මාන්තය පදනම්කරගත් ජීවන රටාවක් දිස්ත්‍රික්කයේ දක්නට ලැබේ. තේ,කෝපි,කෝකෝවා,ගම්මිරිස්,කරාබු,සාදික්කා වැනි අපනයන බෝග ආර්ථිකයේ වැදගත් තැනක් ගනී.මුළු භූමි ප්‍රමාණයෙන් වැඩි ප්‍රමාණයක රබර් වගාව ව්‍යාපත්ව තිබේ.

## වාරි මාර්ග ක්‍රමය

දිස්ත්‍රික්කය පුරා වී ගොවිතැන් කටයුතු සිදු කරනු ලබන්නේ අහස් දිය උපයෝගී කරගනිමිනි.නිශ්චිත වාරිමාර්ග ක්‍රමයක් දිස්ත්‍රික්කය පුරා දක්නට නොමැත.

## වර්ෂාපතන රටාව

කෑගල්ල දිස්ත්‍රික්කය නිරිත දිග තෙත් කලාපයට අයත් වන අතර,අධික වර්ෂාපතනයක් සහ අධික සූර්යතාපයක් ලැබෙන ප්‍රදේශයකි.මෝසම්,සංවහන,හා වාසුළි මඟින් වර්ෂාව ලැබෙන බැවින් වර්ෂය පුරා ව්‍යාප්ත වූ වර්ෂාපතන රටාවක් දැකිය හැකිය.වාර්ෂික වර්ෂාපතනය මි.මී.2500 – මි.මී.3000 අතර වේ. එමෙන්ම මධ්‍ය කඳුකරයෙහි සුළං මුහුනතහි පිහිටා ඇති බැවින් වැඩිම වර්ෂාපතනයක් ලැබෙනුයේ නිරිත දිග මෝසම් සමය වන මැයි - සැප්තැම්බර් කාල සීමාවේදීය. එම ප්‍රමාණය මි.මී.1500 –මි.මී. 2000 අතර වේ.

## ජනගහනය

2011 ජාතික ජන සංගණන වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ මුළු ජනගහනය 20,277,597 ක් වූ අතර,කෑගල්ල දිස්ත්‍රික්කයේ සමස්ත ජනගහනය පුද්ගලයන් 836,603 ක් විය. එය ප්‍රතිශතයක් වශයෙන් ගත්කල 4.01%කි. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වාර්ෂික ජනගහන වර්ධන අනුපාතිකය 2011 වර්ෂයේ දි 0.71% කි. එය කෑගල්ල දිස්ත්‍රික්කයේ 0.61% කි. ජනගහනය වැඩිවීමේ ප්‍රතිශතය ශ්‍රී ලංකාවේ 7.9% ක් වන අතර,මෙම දිස්ත්‍රික්කය තුළ එම අනුපාතිකය 4.01% කි.

ජන සංඛ්‍යාවේ පුමිතිරි අනුපාතිකය සැලකීමේදි 2011 වන විට දිස්ත්‍රික්කයේ ජනගහනයෙන් වැඩි ප්‍රමාණයක් කාන්තාවන් වූ අතර,එම ප්‍රමාණය 436,199 කි. පිරිමි සංඛ්‍යාව 388,663 කි.

දිස්ත්‍රික්කයේ ජන ව්‍යාප්තිය සලකා බැලීමේ දි වැඩිම ජන සංඛ්‍යාවක් ජීවත් වන්නේ වරකාපොල සහ මාවනැල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ දෙකෙහි වන අතර,ජීවත් වන පුද්ගලයන් සංඛ්‍යාව 100,000 ට වඩා වැඩිය. අඩුම ජන ව්‍යාප්තියක් දැකිය හැක්කේ බුලත්කොහුපිටිය හා දැරණියගල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වලයි. එහි ජීවත් වන පුද්ගලයන් සංඛ්‍යාව 55,000ට වඩා අඩුය. 2011 ජන හා සංඛ්‍යාලේඛන වාර්තා වලට අනුව දිස්ත්‍රික්කයේ වයස අවු.15 ට අඩු යැපෙන්නන් සංඛ්‍යාව 204,250 ක් වේ. එමෙන්ම වයස්ගත යැපෙන්නන් සංඛ්‍යාව 121,774 කි ඒ අනුව මුළු යැපෙන්නන් සංඛ්‍යාව 326,024 කි. ශ්‍රම බලකාය නියෝජනය කරන පුද්ගලයන් සංඛ්‍යාව 468,868 කි. මේ අනුව සමස්ථ ජන සංඛ්‍යාවෙන් 24.76% ක් බාල යැපෙන්නන් වන අතර. තවත් 14.75% ක් වැඩිහිටි යැපෙන්නන් වේ. දිස්ත්‍රික්කයේ මුළු ශ්‍රම බලකාය 60.47% කි. මෙම තත්ත්වය ජනගහන විද්‍යාඥයන් පෙන්වාදෙන ආකාරයට යහපත් ප්‍රවණතාවයකි.

## කෑගල්ල දිස්ත්‍රික්කයේ ජනගහන තොරතුරු

| විස්තරය | 2001 සංගණනය | 2011 සංගණනය |
|---|---|---|
| මුළු ජන සංඛ්‍යාව | 784,371 | 836,603 |
| වාර්ෂික වර්ධන වේගය | 0.71 | 0.61 |
| ජනගහන ඝනත්වය | 466 | 497 |
| පුමිතිරි අනුපාතය | 95.9 | 91.7 |
| වයස් ව්‍යුහය | | |
| ❖ අවු. 0 – 14 | 199,682 | 204,261 |
| ❖ අවු. 15- 59 | 498,301 | 510,595 |
| ❖ අවු 60 වැඩි | 86,388 | 121,747 |
| ජන වර්ගය | | |
| ❖ සිංහල | 671,471 | 715,723 |
| ❖ ශ්‍රී ලංකා දෙමළ | 14,246 | 20,250 |
| ❖ ඉන්දියානු දෙමළ | 45,916 | 41,468 |
| ❖ ශ්‍රී ලංකා යෝනක | 52,004 | 57,952 |
| ❖ බර්ගර් | 210 | 577 |
| ❖ මැලේ | 189 | 168 |
| ❖ ශ්‍රී ලංකා චෙට්ටි | 56 | 37 |
| ❖ භාරත | 09 | 04 |
| ❖ වෙනත් | 269 | 424 |
| ආගම් අනුව | | |
| ❖ බෞද්ධ | 664,388 | 707,830 |
| ❖ හින්දු | 53,195 | 53,997 |
| ❖ ඉස්ලාම් | 53,184 | 60,575 |
| ❖ රෝමානු කතෝලික | 8,941 | 8,221 |
| ❖ වෙනත් ක්‍රිස්තියානි | 4,513 | 5,865 |
| ❖ වෙනත් | 150 | 115 |

**<u>දිස්ත්‍රික්කය පිළිබඳ මූලික සංඛ්‍යා තොරතුරු</u>**

| | | |
|---|---|---|
| දිස්ත්‍රික්කයේ නම | - | කෑගල්ල |
| පළාත | - | සබරගමුව |
| සම්පූර්ණ භූමි ප්‍රමාණය | - | ව.කි.මී.1692.8 |
| ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | - | 11 |
| ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව | - | 573 |
| ගම්වැසියන් සංඛ්‍යාව | - | 746,685 |
| ඡන්දබල ප්‍රදේශ සංඛ්‍යාව | - | 09 |
| මහ නගර සභා සංඛ්‍යාව | - | නැත |
| නගර සභා සංඛ්‍යාව | - | 01 |
| ප්‍රාදේශිය සභා සංඛ්‍යාව | - | 11 |
| අමාත්‍යාංශය සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති සංචාරක නිවාඩු | | |
| නිකේතන | - | නැත |
| නිල නිවාස | - | 32 |
| කලාප අධ්‍යාපන නිලධාරින් සංඛ්‍යාව | - | 325 |
| පාසැල් සංඛ්‍යාව | - | 536 |
| ගුරුවරු සංඛ්‍යාව | - | 10,895 |
| පාර්ලිමේන්තු මන්ත්‍රිවරු සංඛ්‍යාව | - | 09 |
| පළාත් සභා මන්ත්‍රිවරු සංඛ්‍යාව | - | 18 |
| පලාත් පාලන ආයතන වල මන්ත්‍රිවරු සංඛ්‍යාව | - | 195 |
| මුළු ජනගහනය | - | 836,603 |
| ඡන්දදායකයින් සංඛ්‍යාව | - | 661,001 |

# කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංවිධාන සටහන



## <u>2015.12.31 ට අනුමත කාර්යමණ්ඩලය</u>

2015 වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් / දිසාපති කාර්යාලයේ හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 11හි කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි සමන්විත විය.

| ශ්‍රේණිය | කළමනාකරණසේවා චක්‍රලේඛය අනුව සේවක සංඛ්‍යාව | 2015.12.31 දිනට සේවයේ නියුක්ත සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 43 | 38 | 05 |
| තෘතියික මට්ටම | 30 | 23 | 07 |
| ද්විතියික මට්ටම | 1,048 | 1,014 | 34 |
| ප්‍රාථමික මට්ටම | 106 | 106 | -- |
| **එකතුව** | 1,227 | 1,182 | 53 |

# 2015 ක්‍රියාකාරී සැලැස්ම - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කෑගල්ල

| කාර්යයන් | කාර්ය අදාළ නිලධාරි | අධීක්ෂණය කිරිම | ආරම්භක දිනය | අවසන් දිනය | කාලය/මාස | වැයවන මුදල (රු.මිලියන) |
|---|---|---|---|---|---|---|
| 1. ප්‍රාදේශිය පරිපාලන මඟින් ව්‍යවස්ථාපිත කාර්යයන් ඉටු කිරිම | ප්‍රාදේශිය ලේකම් | දිසාපති/දිස්ත්‍රික් ලේකම් | 2015.01.01 | 2015.12.31 | 12 | 536.19 |
| 2 සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම. | | | | | | |
| i. ගම් 15000 වැඩසටහන | නි.අ.(සැලසුම්) | අධ්‍යක්ෂ(සැල) | 2015..01.01 | 2015.12.31 | 12 | 568.66 |
| ii. මාතෘ සායන සං.වැඩසටහන | නි.අ.(සැලසුම්) | අධ්‍යක්ෂ(සැල) | 2015.01.01 | 2015.12.31 | 12 | 1.00 |
| iii. විශේෂ සංවර්ධන වැඩසටහන | නි.අ.(සැලසුම්) | අධ්‍යක්ෂ(සැල) | 2015.01.01. | 2015.12.31 | 12 | 10.00 |
| iv.කඳුරට නව ගම්මාන සං.වැඩසටහන | නි.අ.(සැලසුම්) | අධ්‍යක්ෂ(සැල) | 2015.01.01 | 2015.12.31 | 12 | 7.50 |
| v.අලෙවි නියෝජිතයින්සඳහා නිවාස වැඩසටහන | නි.අ.(සැලසුම්) | අධ්‍යක්ෂ(සැල) | 2015.01.01 | 2015.12.31 | 12 | 17.00 |
| vi.ක්‍රිඩාපිටි සං.වැඩසටහන | නි.අ.(සැලසුම්) | අධ්‍යක්ෂ(සැල) | 2015.01.01 | 2015.12.31 | 12 | 7.00 |
| vii.හින්දු කෝවිල් වැඩසටහන | නි.අ.(සැලසුම්) | අධ්‍යක්ෂ(සැල) | 2015.01.01 | 2015.12.31 | 12 | 1.90 |
| 3. සමෘද්ධිඅරමුදල් මඟින් මානව සංවර්ධන/ භෞතික සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. | ප්‍රාදේශිය ලේකම් සමෘ.සහ.කොම සාරිස් | දිසාපති/දිස්ත්‍රික් ලේකම් ප්‍රාදේශිය ලේකම් | 2015.01.01 | 2015.12.31 | 12 | 71,210 |
| 4. පරිපාලන කටයුතු සඳහා ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම හා වැඩිදියුණු කිරිම. | ප්‍රධාන ගණකාධිකාරි | දිසාපති/දිස්ත්‍රික් ලේකම් | 2015.01.01 | 2015.12.31 | 12 | 29.21 |
| 5. සමාජ සුබසාධන කටයුතු මෙහෙයවීම.<br>i . පරිවාස හා ළමාරක්ෂක | අතිරේක දිස්ත්‍රික් ලේකම් | දිසාපති/දිස්ත්‍රික් ලේකම් | 2015.01.01 | 2015.12.31 | 12 | 1.42 |
| 6. වෙනත් දෙපාර්තමේන්තු හා රාජ්‍ය ආයතන<br>i. අරමුදල් පරිපාලනය<br>ii. සම්බන්ධීකරණ හා පරිපාලන කටයුතු. | ප්‍රධාන ගණකාධිකාරි අංශභාර නිළධාරින් | දිසාපති/දිස්ත්‍රික් ලේකම් | 2015.01.01<br>2015.01.01 | 2015.12.31<br>2015.12.31 | පරිපාලන වියදම් (වියදම් හා ආදායම්) දිස්ත්‍රික් පරිපාලනය යටතේ දක්වා ඇත. | |
| 7. දිස්ත්‍රික් පරිපාලනය | අංශභාර නිළධාරින් | දිසාපති/දිස්ත්‍රික් ලේකම් | 2015.01.01 | 2015.12.31 | 12 | 64.09 |

**<u>අභ්‍යන්තර විගණන කටයුතු</u>**

2015 වර්ෂය තුළ මෙම අංශය මගින් සිදුකර ඇති අභන්තර විගණනයන් පිළිබඳ සාරාංශ වාර්තාව පහත දැක්වේ.

| අනු අංකය | විගණනය කල ප්‍රා.ලේ.කාර්යාල | විගණනය කල කාල පරිච්ඡේදය | විෂය ක්ෂේත්‍රය |
|---|---|---|---|
| 1 | දෙහිඕවිට | 2014 පෙබරවාරි සිට 2015 ජනවාරි දක්වා | 1.අත ඉතිරි මුදල්,ගබඩා පරික්ෂාව සහ බැංකු සැසඳුම්.<br>2.පොදු තැන්පත් ගිණුම,අත්තිකාරම් බී ගිණුම ,වැටුප් ලෙජර සහ වැය ලෙජර පරික්ෂාව .<br>3.පෞද්ගලික ලිපිගොණු,පැමිණීම සහ නිවාඩු,වාහන . පාලනය හා නඩත්තුව පරික්ෂාව. |
| 2 | යටියන්තොට | 2014 ජුලි සිට 2015 මැයි දක්වා | 1.අත ඉතිරි මුදල් සහ බැංකු සැසඳුම් පරික්ෂාව.<br>2.පොදු තැන්පත් ගිණුම,අත්තිකාරම් බී ගිණුම පරික්ෂාව .<br>3. වැය ලෙජර පරික්ෂාව, පැමිණීමේ ලේඛණය සමඟ නිවාඩුපරික්ෂාව. |
| 3 | රඹුක්කන | 2010-2013 විශ්‍රාම වැටුප්<br>2014 අප්‍රේල් සිට 2014 දෙසැම්බර් දක්වා | 1.2010-2013 හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම.<br>2. අත ඉතිරි මුදල්,ගබඩා පරික්ෂාව.<br>3.බැංකු සැසඳුම්, පොදු තැන්පත් ගිණුම,අත්තිකාරම් බී . ගිණුම පරික්ෂාව.<br>4.පුවත්පත් අපහරණය හා නිවාඩු දුම්රිය බලපත්‍ර<br>5. උපයනවිට ගෙවීම් බදු පරික්ෂාව.<br>6. තත්කාර්ය අතුරු අග්‍රිම පරික්ෂාව |
| 4 | අරණායක | 2014 පෙබරවාරි සිට 2015 ජනවාරි දක්වා | 1. අත ඉතිරි මුදල්,ගබඩා පරික්ෂාව, අත්තිකාරම් බී . ගිණුම.<br>2. පොදු තැන්පත් ගිණුම හා වැටුප් ලේඛණ පරික්ෂාව.<br>3.වැඩිහිටි ආධාර,දුම්රිය බලපත්‍ර හා පැමිණීම සහ නිවාඩු. |
| 5 | දැරණියගල | 2014ඔක්තෝබර් සිට 2015 ජුලි දක්වා | 1. පොදු තැන්පත් ගිණුම,අත්තිකාරම් බී ගිණුම . පරික්ෂාව.<br>2. වැය ලෙජර හා වැටුප් ලේඛණ පරික්ෂාව<br>3.පැමිණීමේ ලේඛණ ,නිවාඩු ලේඛණ,පෞද්ගලික ලිපිගොණු පරික්ෂාව. |

| | | | |
|---|---|---|---|
| 6 | ගලිගමුව | 2010-2013 විශ්‍රාම වැටුප්<br>2014 නොවැම්බර් සිට<br>2015 ඔක්තෝබර් දක්වා | 1. අත ඉතිරි මුදල්,ගබඩා පරික්ෂාව.<br>2. ගමන් වියදම් පරික්ෂාව,දුම්රිය බිල්පත් පරික්ෂාව.<br>. |
| 7 | කෑගල්ල | 2010-2013 විශ්‍රාම වැටුප්<br>2014 නොවැම්බර් සිට<br>2015 ඔක්තෝබර් දක්වා | 1. අත ඉතිරි මුදල්,ගබඩා පරික්ෂාව.<br>2.ගමන් වියදම් පරික්ෂාව<br>3.අත්තිකාරම් බි ගිණුම,පැමිණීම හා නිවාඩු ලේඛණ පරික්ෂාව. |
| 8 | මාවනැල්ල | 2010-2013 විශ්‍රාම වැටුප්<br>2014 ජුනි සිට 2015<br>ජනවාරි දක්වා | 1. අත ඉතිරි මුදල්,පොදු තැන්පත් ගිණුම හා බැංකු සැසඳුම් පරික්ෂාව<br>2. දුම්රිය බිල්පත්,පැමිණීම හා නිවාඩු ලේඛණ පරික්ෂාව.<br>3. වැඩිහිටි ආධාර, අත්තිකාරම් බි ගිණුම.<br>4.මිලදී ගැනීම් හා බෙදාහැරීම් පරික්ෂාව. |
| 9 | රුවන්වැල්ල | 2014 ජුලි සිට 2015 මාර්තු<br>දක්වා | 1. අත ඉතිරි මුදල්,පොදු තැන්පත් ගිණුමහා ප්‍රසම්පාදන ක්‍රියාවලි පරික්ෂාව.<br>2.සංවර්ධන ව්‍යාපෘති පසුවිපරම් හා නිති රෙගුලාසි වලට අනුකූල නොවූ වියදම්<br>3.පැමිණීම,නිවාඩු හා පෞද්ගලික ලිපිගොණු පරික්ෂාව. |
| 10 | වරකාපොල | 2014 අගෝස්තු සිට 2015<br>ජුලි දක්වා | 1. අත ඉතිරි මුදල්,ගබඩා පරික්ෂාව.<br>2.වැටුප් ලේඛන පරික්ෂාව හා පෞද්ගලික ලිපිගොණු පරික්ෂාව<br>3.දුම්රිය බිල්පත් හා ගමන් වියදම් පරික්ෂාව. |
| 11 | බුලත්කොහුපිටිය | 2014 ජුලි සිට 2015 ජුලි<br>දක්වා | 1. අත ඉතිරි මුදල් හා බැංකු සැසඳුම් පරික්ෂාව.<br>2.පොදු තැන්පත් ගිණුම හා ගබඩා පරික්ෂාව.<br>3.පෞද්ගලික ලිපිගොණු හා වටුප් ලේඛණ පරික්ෂාව. |

## ආදායම් රැස්කිරිම

දිස්ත්‍රික්කයේ ආදායම් රැස් කිරිමේ නියෝජිත ආයතනයක් ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කරයි. මේ සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 11 උපකාරි වේ.

| අංකය | ආදායම් සංකේතය | ආදායම් විස්තරය | එකතු කළ ආදායම 2014 | එකතු කළ ආදායම 2015 |
|---|---|---|---|---|
| 1 | 10-03-07-02 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට අදාළ ලියාපදිංචි කිරිමේ ගාස්තු | 17,875,550.00 | 16,580,544.86 |
| 2 | 10-03-07-03 | පෞද්ගලික දැව ප්‍රවාහනය | 1,393,291.00 | 1,484,987.00 |
| 3 | 10-03-07-99 | අනෙකුත් | 8,012,575.61 | 9,321,647.40 |
| 4 | 10-03-07-05 | මහජන ආරක්ෂක අමාත්‍යාංශයට අදාළ බලපත්‍ර ගාස්තු | 210,350.00 | 228,730.00 |
| 5 | 20-02-01-01 | රජයේ ගොඩනැඟිලි කුලී | 1,129,234.80 | 978,267.33 |
| 6 | 20-02-02-99 | වෙනත් | 5,823,237.50 | 6,419,824.30 |
| 7 | 20-03-02-07 | විදේශ ගමන් බලපත්‍ර ගාස්තු | -- | -- |
| 8 | 20-03-02-13 | විභාග හා අනෙකුත් ගාස්තු | 5,244,700.00 | 85,450.00 |
| 9 | 20-03-02-14 | මෝටර් රථ ප්‍රවාහන අණ පනත යටතේ අයකරනු ලබන ගාස්තු හා අනෙකුත් ලැබීම් | 43,975,377.60 | 59,707,770.00 |
| 10 | 20-03-02-99 | විවිධ | 16,619,242.23 | 826,281.17 |
| 11 | 20-03-03-00 | දඩ මුදල් හා රාජ සන්තක කිරිම් | 447,793.18 | 24,690.00 |
| 12 | 20-03-99-00 | අනෙකුත් ලැබීම් | 39,648,324.86 | 16,192,408.53 |
| 13 | 20-04-01-00 | සමාජ සංරක්ෂණ දායක මුදල් | 27,865,274.61 | 22,216,004.57 |
| 14 | 20-06-02-00 | ප්‍රාග්ධන වත්කම් විකිණීම් | 12,835.00 | -- |
| | | **එකතු කල මුළු ආදායම** | 168,257,786.39 | 134,066,602.02 |

වර්ගය - ආදායම් ගිණුම

| විස්තරය | මූල්‍ය කාර්‍ය සාධනය | | | | |
|---|---|---|---|---|---|
| | රුපියල් '000 | | | | |
| | අදාළ වර්ෂය | | පෙර වර්ෂයේ | විචලනය | |
| | නියමිත | සත්‍ය | සත්‍ය | නියමිත | පෙර වර්ෂයේ සත්‍ය |
| ආදායම් සංකේත | | | | | |
| | | | - | | |
| 10-03-07-02 | - | 16,682 | 17,876 | | (1,194) |
| 10-03-07-03 | - | 1,486 | 1,393 | | 93 |
| 10-03-07-99 | 7,475 | 9,322 | 8,013 | | 1,309 |
| 10-03-07-05 | 250 | 0.230 | 210 | | (210) |
| 20-02-01-01 | - | 1 | 1,129 | | (1,128) |
| 20-02-02-99 | 5,843 | 6,438 | 5,823 | | 615 |
| 20-03-02-07 | - | - | | | |
| 20-03-02-13 | - | 1.000 | 5,245 | | (5,244) |
| 20-03-02-14 | - | 60,439 | 43,975 | | 16,464 |
| 20-03-02-99 | 763 | 1 | 16,619 | | (16,618) |
| 20-03-03-00 | 761 | 0.025 | 448 | | (448) |
| 20-03-99-00 | 11,596 | 17,480 | 39,648 | | (22,168) |
| 20-04-01-00 | - | 22,216 | 27,865 | | (5,649) |
| 20-06-02-00 | - | - | 13 | | (13) |
| එකතුව | | 134,066 | 168,257 | | |

# මානව සම්පත් සංවර්ධනය

## රැකියා ප්‍රවර්ධන සේවා අංශයේ කටයුතු

දිස්ත්‍රික්කයේ මානව සම්පත් සංවර්ධන කටයුතු සඳහා මෙම අංශයේ දායකත්වය ඉතා ඉහළ මට්ටමක පවති. වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරි ඇතුළුව එක් ව්‍යාපෘති නිලධාරි වරයෙකුගෙන් සහ මානව සම්පත් සංවර්ධන සහකාර නිලධාරින් 06 දෙනෙකුගෙන් හා ඵලදායිතා නිලධාරින් 05 දෙනෙකුගෙන් මෙම අංශය සමන්විත වේ.

මෙම අංශයන් විසින් 2015 වසරේදි සිදු කරන ලද කාර්යයන් වල වාර්ෂික ප්‍රගති සාරාංශය පහත දැක්වේ.

| **වෘත්තීය මාර්ගෝපදේශය** | | | |
|---|---|---|---|
| **දැනුවත් කිරීම්** | **වැඩසටහන්** | **ප්‍රතිලාභීන්** | **වියදම** |
| • පාසල් සිසුන් (සා/පෙල හා උ/පෙ) | 165 | 4,332 | -- |
| • .ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 05 | 191 | 162,187.00 |
| • රැකියා අපේක්ෂිතයින් | 105 | 3,453 | 202,910.00 |
| • ව්‍යවසායකයින් | 07 | 326 | 121,055.00 |
| • රැකියාපොළ - රැකියා 100 වැඩසටහන | 02 | 1,947 | 294,065.00 |
| **රැකියා සඳහා යොමු කිරීම්** | | | |
| • ලියාපදිංචි කිරීම් | 1,605 | | |
| • රැකියා ඇබෑර්තු ලබා ගැනීම් | 993 | | |
| • සම්මුඛ පරීක්ෂණයට යොමු කිරීම් | 1,315 | | |
| • රැකියාගත කිරීම් | 480 | | |
| **ජාතික රක්ෂණ භාර අරමුදල** | | | |
| යතුරු පැදි රක්ෂණය | 2,200 | | 11,000,000.00 |
| රජයේ වාහන රක්ෂණය | 10 | | 700,000.00 |
| ගොඩනැගිලි රක්ෂණය | 01 | | 12,500.00 |

## <u>මැතිවරණ කටයුතු</u>

කැගල්ල දිස්ත්‍රික්කයේ ජන්ද බල ප්‍රදේශ සංඛ්‍යාව 09කි. මෙහි නගර සභා 01 ක් සහ ප්‍රාදේශිය සභා 11 ක් ඇත. ජන්ද හිමි නාමලේඛනය යාවත් කාලීන කිරිම.2015.08.17 දින පාර්ලිමේන්තු මහ මැතිවරණය පැවැත්වීමට අදාළ කටයුතු කිරිම.

| <u>ජන්ද බල ප්‍රදේශය</u> | <u>අක්ෂරය</u> |
|---|---|
| දැදිගම | අ |
| ගලිගමුව | ආ |
| කැගල්ල | ඇ |
| රඹුක්කන | ඈ |
| මාවනැල්ල | ඉ |
| අරණායක | ඊ |
| යටියන්තොට | උ |
| රුවන්වැල්ල | ඌ |
| දැරණියගල | එ |

| <u>නගර සභා</u> | <u>ප්‍රාදේශිය සභා</u> |
|---|---|
| 1. කැගල්ල | 1. කැගල්ල |
| | 2. ගලිගමුව |
| | 3. වරකාපොල |
| | 4. රඹුක්කන |
| | 5. මාවනැල්ල |
| | 6. අරණායක |
| | 7. යටියන්තොට |
| | 8. දැරණියගල |
| | 9. රුවන්වැල්ල |
| | 10. දෙහිඕවිට |
| | 11. බුලත්කොහුපිටිය |

## මාධ්‍ය හා ප්‍රවෘත්ති කටයුතු

දිස්ත්‍රික් මාධ්‍ය ඒකකය ප්‍රවෘත්ති නිලධාරි සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේ සහකාර නිලධාරිනියකගෙන් සහ සංවර්ධන නිලධාරින් දෙදෙනෙකුගෙන් සමන්විත වේ. 2015 වර්ෂයේ දි ප්‍රවෘත්ති අංශය මගින් සිදුකල කාර්යයන් පහත දැක්වේ.

1.ජන මාධ්‍ය වැඩමුළු පැවැත්වීම - 02
2.ප්‍රවෘත්ති නිවේදන නිකුත් කිරිම - 240
3.රජයේ නිල පුවත් වෙබ් අඩවියට ප්‍රවෘත්ති නිවේදන නිකුත් කිරිම - 205
4.මාධ්‍ය සම්බන්ධීකරණ කටයුතු - 82

## ආපදා කළමනාකරණ කටයුතු

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකය සහ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මගින් දිස්ත්‍රික්කයේ ආපදා කටයුතු අවම කිරිමට මහත් වෙහෙසක් ගනී. දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකය සහකාර අධ්‍යක්ෂ වරයකුගෙන් සහ සහකාර සම්බන්ධීකරන නිලධාරි වරයකුගෙන් සමන්විත වේ. දිස්ත්‍රික් ආපදා සහන සේවා මධ්‍යස්ථානය සංවර්ධන නිලධාරිවරයකුගෙන් සමන්විතවේ.

## 2014 / 2015 වර්ෂ වල දිස්ත්‍රික්කයේ අර්ධහානි පිළිබඳ සංඛ්‍යා තොරතුරු

| | 2014 වර්ෂය | | | | | | | 2015 වර්ෂය | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කාර්යාලය | ගංවතුර | නාය යෑම් | ගං/නාය | අධික වර්ෂාව | ඉවුරු කඩා වැටීම | සුළි සුලං | වෙනත් | ගංවතුර | නාය යෑම් | ගස් කඩා වැටීම | අධික වර්ෂාව | ඉවුරු කඩා වැටීම | සුළි සුලං | වෙනත් |
| දෙහිඕවිට | -- | -- | 04 | 02 | 01 | 05 | -- | 06 | 15 | 08 | -- | 11 | 03 | -- |
| යටියන්තොට | -- | -- | 40 | 02 | 10 | 15 | 03 | 13 | 16 | 12 | 02 | 13 | -- | 03 |
| රඹුක්කන | 21 | 06 | 04 | 03 | 08 | -- | -- | -- | 05 | 02 | 03 | 12 | -- | 02 |
| අරණායක | -- | -- | 09 | 03 | 06 | -- | 03 | -- | 02 | 03 | -- | 03 | -- | -- |
| දැරණියගල | -- | -- | -- | -- | 04 | -- | -- | -- | 18 | 13 | 07 | 12 | 05 | 06 |
| ගලිගමුව | 04 | -- | 02 | 04 | -- | -- | -- | 03 | 05 | 04 | -- | 08 | -- | 02 |
| කෑගල්ල | -- | -- | 16 | 05 | 03 | 10 | 04 | -- | 03 | 02 | 05 | -- | -- | -- |
| මාවනැල්ල | 22 | -- | 08 | 05 | 05 | 20 | -- | 05 | 03 | 09 | 08 | 04 | 13 | 01 |
| රුවන්වැල්ල | -- | -- | 02 | -- | 03 | -- | 02 | -- | 04 | 01 | -- | 04 | -- | -- |
| වරකාපොල | 12 | -- | 04 | -- | 04 | -- | 02 | -- | -- | 03 | -- | 02 | -- | 02 |
| බුලත්කොහුපිටිය | | | -- | -- | -- | -- | -- | -- | 09 | 18 | 07 | 23 | 02 | 01 |
| එකතුව | 59 | 06 | 89 | 24 | 44 | 50 | 14 | 27 | 80 | 75 | 32 | 92 | 23 | 17 |

## 2014 /2015 වර්ෂ වල දිස්ත්‍රික්කයේ අර්ධහානි සඳහා ගෙවීම් පිළිබඳ තොරතුරු ‘000

| | 2014 වර්ෂය | | | | | | | 2015 වර්ෂය | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කාර්යාලය | ගංවතුර | නායයෑම් | ගං/නාය | අධික වර්ෂාව | ඉවුරු කඩාවැටීම | සුළිසුළං | වෙනත් | ගංවතුර | නායයෑම් | ගස් කඩාවැටීම | අධික වර්ෂාව | ඉවුරු කඩාවැටීම | සුළිසුළං | වෙනත් |
| දෙහිඕවිට | -- | -- | 0.20 | 0.10 | 0.05 | 0.25 | -- | | | | | | | |
| යටියන්තොට | -- | -- | 0.73 | 0.03 | 0.18 | 0.27 | 0.05 | | | | | | | |
| රඹුක්කන | 0.68 | 0.19 | 0.13 | 0.09 | 0.26 | -- | -- | | | | | | | |
| අරණායක | -- | -- | 0.29 | 0.09 | 0.19 | -- | 0.09 | | | | | | | |
| දැරණියගල | -- | -- | -- | -- | 0.16 | -- | -- | | | | | | | |
| ගලිගමුව | 0.38 | -- | 0.19 | 0.38 | -- | -- | -- | | | | | | | |
| කෑගල්ල | -- | -- | 0.31 | 0.97 | 0.05 | 0.19 | 0.07 | | ප්‍රතිපාදන ඉල්ලම්කර ඇත. | | | | | |
| මාවනැල්ල | 0.17 | -- | 0.06 | 0.04 | 0.04 | 0.15 | | | | | | | | |
| රුවන්වැල්ල | -- | -- | 0.04 | -- | 0.06 | -- | 0.04 | | | | | | | |
| වරකාපොල | 0.40 | -- | 0.13 | -- | 0.13 | -- | 0.06 | | | | | | | |
| බුලත්කොහුපිටිය | -- | -- | -- | -- | -- | -- | -- | | | | | | | |
| එකතුව | 1.63 | 0.19 | 3.71 | 1.7 | 1.12 | 0.86 | 0.31 | | | | | | | |

## 2014 /2015 වර්ෂ වල දිස්ත්‍රික්කයේ පූර්ණහානි පිළිබඳ සංඛ්‍යා තොරතුරු

| | 2014 වර්ෂය | | | | | | | 2015වර්ෂය | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කාර්යාලය | ගංවතුර | නායයෑම් | ගං/නාය | අධික වර්ෂාව | ඉවුරු කඩාවැටීම | සුළිසුළං | වෙනත් | ගංවතුර | නායයෑම් | ගස් කඩාවැටීම | අධික වර්ෂාව | ඉවුරු කඩාවැටීම | සුළිසුළං | වෙනත් |
| දෙහිඕවිට | -- | -- | 02 | -- | -- | -- | -- | | 03 | 01 | -- | 02 | -- | -- |
| යටියන්තොට | | | 03 | 01 | 02 | | | | -- | -- | -- | -- | -- | -- |
| රඹුක්කන | 12 | -- | 08 | 03 | 06 | -- | -- | | 03 | 02 | -- | 04 | -- | -- |
| අරණායක | -- | -- | 01 | -- | 02 | -- | -- | | 02 | 01 | -- | 03 | -- | 01 |
| දැරණියගල | -- | 28 | 01 | -- | -- | -- | -- | | 04 | 04 | 03 | 05 | -- | -- |
| ගලිගමුව | 03 | -- | 02 | -- | 02 | -- | -- | 03 | -- | 0 | -- | 05 | -- | -- |
| කෑගල්ල | -- | 02 | 03 | 02 | 03 | -- | -- | | 03 | 04 | -- | 10 | -- | -- |
| මාවනැල්ල | 03 | -- | 12 | -- | 05 | -- | 02 | | 02 | 05 | -- | 04 | -- | -- |
| රුවන්වැල්ල | -- | -- | 01 | -- | -- | -- | -- | | -- | 03 | -- | 02 | -- | -- |
| වරකාපොල | 02 | -- | .03 | 01 | 02 | -- | -- | | 01 | 04 | -- | 03 | -- | -- |
| බුලත්කොහුපිටිය | -- | -- | -- | -- | -- | -- | -- | | 02 | 05 | -- | 03 | -- | 02 |
| එකතුව | 20 | 30 | 36 | 07 | 22 | -- | 02 | 03 | 20 | 33 | 03 | 41 | -- | 03 |

## 2014/2015 වර්ෂ වල දිස්ත්‍රික්කයේ පූර්ණ හානි සඳහා ගෙවීම් පිළිබඳ තොරතුරු

'000

| | 2014 වර්ෂය | | | | | | | 2015 වර්ෂය | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කාර්යාලය | ගංවතුර | නායයෑම් | ගං/නාය | අධික වර්ෂාව | ඉවුරු කඩා වැටීම | සුළිසුළං | වෙනත් | ගංවතුර | නාය යෑම් | ගස් කඩා වැටීම | අධික වර්ෂාව | ඉවුරු කඩා වැටීම | සුළිසුළං | වෙනත් |
| දෙහිඕවිට | -- | -- | .0.20 | -- | -- | -- | -- | -- | -- | -- | -- | -- | -- | -- |
| යටියන්තොට | -- | -- | 0.14 | 0.04 | 0.09 | -- | -- | -- | -- | -- | -- | -- | -- | -- |
| රඹුක්කන | 0.82 | -- | 0.55 | 0.20 | 0.41 | -- | -- | -- | -- | -- | -- | -- | -- | -- |
| අරණායක | -- | -- | 0.13 | -- | 0.26 | -- | -- | -- | -- | -- | -- | -- | -- | -- |
| දැරණියගල | -- | 0.65 | 0.02 | -- | | -- | -- | -- | ප්‍රතිපාදන ඉල්ලම්කර ඇත | | | | | |
| ගලිගමුව | 0.12 | -- | 0.08 | -- | 0.08 | -- | -- | -- | -- | -- | -- | -- | -- | -- |
| කෑගල්ල | -- | 0.22 | 0.33 | 0.22 | 0.33 | -- | -- | -- | -- | -- | -- | -- | -- | -- |
| මාවනැල්ල | 0.30 | -- | 1.20 | -- | 0.50 | | 0.20 | -- | -- | -- | -- | -- | -- | -- |
| රුවන්වැල්ල | -- | -- | 0.10 | -- | | -- | -- | -- | -- | -- | -- | -- | -- | -- |
| වරකාපොල | 0.16 | -- | 0.24 | 0.08 | 0.16 | -- | -- | -- | -- | -- | -- | -- | -- | -- |
| බුලත්කොහුපිටිය | -- | -- | -- | -- | -- | -- | -- | -- | -- | -- | -- | -- | -- | -- |
| එකතුව | 1.4 | 0.87 | 2.99 | 0.54 | 1.83 | -- | 0.20 | -- | -- | -- | -- | -- | -- | -- |

## ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් අංශයේ කටයුතු

### කාර්ය මණ්ඩල සංයුතිය

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| 1.ඉඩම් රෙජිස්ට්‍රාර් | 01 |
| 2. අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් | 06 |
| 3.සංවර්ධන නිලධාරි | 02 |
| 4.කළමනාකරණ සහකාර | 13 |
| 5.ලේඛන සහකාර | 10 |
| 6.කාර්යාල කාර්ය සේවක | 08 |
| 7.පොත් බැඳුම්කරු | 01 |

2015 වර්ෂයේ දි මෙම අංශය මඟින් සිදු කරන ලද පුද්ගලයන් හා ඉඩම් ලියාපදිංචි කිරිමේ කටයුතු පහත දැක්වේ.

1.ලියාපදිංචියට ලද ඔප්පු සංඛ්‍යාව 36,805

2.ලද ඔප්පු දෙවන පිටපත් සංඛ්‍යාව 28,752

3.සහතික පිටපත් නිකුත් කල ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව

i. ඉඩම් ලේඛණ 23,140

ii. ඔප්පු පිටපත් 6,421

4.ලේඛණ සෙවීමට ලද ඉල්ලුම්පත් සංඛ්‍යාව

i. ඉඩම් ලේඛණ 4,465

ii. ඔප්පු හා වෙනත් ලේඛණ 32

5.අයකර ගන්නා ලද ගාස්තු ප්‍රමාණයන්

